ශීර්ෂය - 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

---------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාවිසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

---

### 2.1 වියදම් කළමනාකරණය

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයන් 06 ක් හා මූලධන වැය විෂයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුළ උපයෝජනය කළ පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයන් සියයට 30 සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | කොවිඩ් වසංගත තත්ත්වය හා ගෙවීම් කිරීම සඳහා රාජ්‍ය නොවන ආයතන වලින් අදාල වවුචර්පත් ඉදිරිපත් නොවීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | වාර්ෂික ඇස්තමේන්තු මඟින් අධි ප්‍රතිපාදන සලසා ගැනීම පාලනය කලයුතු වීම. |

### 2.2 වත්කම් කළමනාකරණය

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශයේ වියදමින් දෙපාර්තමේන්තුවේ සිදුකරන ලද ඒකතුව රු.22,160,324 ක් වටිනාකමකින් යුතු වත්කම් නිසි පරිදි දෙපාර්තමේන්තුව වෙත භාරගෙන, ලේඛණගත කිරීමට අවශ්‍ය කටයුතු මෙතෙක් සිදුකර නොතිබුණි. | දෙපාර්තමේන්තුවෙහි නවීකරණ කටයුතු මුදල් අමාත්‍යාංශයේ වියදමින් සිදුකරන ලද අතර , මුදල් අමාත්‍යාංශය විසින් අවශ්‍ය ලේඛන විධිමත් පරිදි මෙම දෙපාර්තමේන්තුව වෙත 2020.12.31 දිනට පෙර බාර දී නොතිබීම නිසා ඒවා පරීක්ෂාකර දෙපාර්තමේන්තු පොත්වලට ඇතුළත් කිරීමේ කටයුතු ප්‍රමාද විය. ඒම කටයුතු දැනටමත් සිදුකරමින් පවතී. | දෙපාර්තමේන්තුවට අදාළ වත්කම් භාරගැනීම හා ලේඛනගත කිරීම කඩිනම් කිරීම. |

## 2.3 නීති,රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------- | ----------- |
| (අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10:1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 6 ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවලට අනුකූල වන පරිදි පිළියෙල කලයුතු විය. සමාලෝචිත වර්ෂය අවසාන දිනට භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ ශේෂයක් වේ නම් එම ශේෂය භාණ්ඩාගාරයට පියවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ ද එම ශේෂයම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ මුදල් හා මුදල්වලට සමාන දෑ යටතේ ද පෙන්විය යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ ශේෂය වූ රු. 944,817 ක වටිනාකම එසේ දක්වා නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ මුළු අග්‍රිම ශේෂය 2020.12.31 දින වන විට පියවා ඇති බැවින්, 2020.12.31 දිනට තවදුරටත් ජංගම වගකීම් ලෙස ඇතුලත් කිරීමට අග්‍රිම ශේෂයක් නොමැත. | චක්‍රලේඛ උපදෙස් පරිදි ක්‍රියාකළ යුතුවීම. |
| (ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10:1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 6 ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA – C ආකෘතිය) දළ පදනමින් පිළියෙල කලයුතු වුවත් විගණනයට ඉදිරිපත් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශය එසේ පිළියෙල කර නොතිබීම හේතුවෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) | වර්ෂය තුළ අත්තිකාරම් අයකරගැනීම රු.11,214,584 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණේ රු. 4,130,417 ක් වීමෙන් රු. 7,084,167 කින් මුදල් ගලාඒම අඩුවෙන් දක්වා තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 10.1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුලත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA - Cආකෘතිය) දළ පදනමින් පිළියෙල කර ඉදිරිපත් කර ඇත. | -එම- |
| (ii) | අත්තිකාරම් ගෙවීම් රු. 10,113,791 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු.3,988,009 ක් ලෙස දක්වා තිබුණි. මේ නිසා රු. 6,125.782 ක් මුදල් ගලායාම් අඩුවෙන් දක්වා තිබුණි. | | |

**3.** **මෙහෙයුම් සමාලෝචනය හා කාර්ය සාධනය**

-----------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රජයේ ණයවලට අදාළ දත්ත පදනමක් පවත්වා ගැනීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් විය. එම ණය ලබාගැනීම, ආපසු ගෙවීම හා සේවාකරණයට අදාළ පද්ධතියේ ඇතුළත් තොරතුරු හා ඒ හා සම්බන්ධ අනෙකුත් පාර්ශව සතු තොරතුරු එකවර යාවත්කාලීන වන අයුරින් පද්ධතිය සංවර්ධනය කර නොතිබීම හේතුවෙන් එම පාර්ශව හා දෙපාර්තමේන්තු සතු තොරතුරුවල පහත වෙනස්කම් නිරීක්ෂණය විය. | | | |
| | (I) | ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ තොරතුරු වල අඩංගු වූ විදේශ ණය සේවාකරණයට අදාළ රු. මිලියන 222.6 ක වටිනාකමක් දෙපාර්තමේන්තු පද්ධතියේ ඇතුළත් වී නොතිබීම. | ණය මුදල් 02 ක් සඳහා ගෙවන ලද නියෝජිත හා ඇපකර ගාස්තු වෙනත් වර්ගීකරණයකින් දක්වා ඇති අතර අනෙක් ණය ගිවිසුම් සෘජුවම අදාළ ආයතන සමඟ ගිවිසුම් ගතවූ ව්‍යාපෘති වේ. ඊට අදාළ බැඳීම් ගාස්තු පද්ධතියේ සටහන් කර ඇත. | අදාළ සියළු පාර්ශව සමඟ නිවැරදි හා යාවත්කාලීන තොරතුරු ඇතුළත් පද්ධතියක් සංවර්ධනය කර පවත්වාගෙන යායුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (II) | දෙපාර්තමේන්තුවේ පද්ධතියේ ඇතුළත් වූ විදේශ ණය සේවාකරණයට අදාළ රු. මිලියන 461 ක වටිනාකමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තු තොරතුරු වල ඇතුළත් වී නොතිබීම. | ගිවිසුම් ප්‍රකාරව මෙම ණය සඳහා උපයෝජන කාලය තුළ පොළිය හා බැඳීම් ගාස්තු ප්‍රාග්ධනිත කරනු ලැබේ. ඒ අනුව එම ආයතනවලට අදාළ ප්‍රාග්ධනිත කරන ලද බැඳීම් ගාස්තු පද්ධතිය තුළ ඇතුළත් වන නමුත් මුදලින් ගෙවීමක් නොවීම මත ශ්‍රී ලංකා මහ බැංකු තොරතුරුවල ඇතුළත් නොවේ. | -එම- |
| (III) | දෙපාර්තමේන්තුවේ පද්ධතියේ ඇතුළත් විදේශ ණය 02 කට අදාළ එකතුව රු. මිලියන 1,337 ක ණය ශේෂ ගිණුම් ගත වී නොතිබීම. | ප්‍රදානකරුගේ ප්‍රමාදයක් හේතුවෙන් එක් ණය මුදලක් සඳහා 2019 ට අදාළ ණය හා පොළී මුදල්, 2020 වර්ෂයේදී ගෙවා ඇති අතර පද්ධතිය තුළ අදාළ දිනට සටහන් කිරීම සිදුකර ඇත. තවත් ණය මුදල් දෙකක අඩුවෙන් හා වැඩියෙන් සටහන් වීම අතර වෙනස වූ රු. මිලියන 10 ක්, ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට ලැබී ඇතත් පද්ධතියට ඇතුළත් කර ඇත්තේ 2021 වර්ෂයේදීය. | -එම- |
| (IV) | 2020 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් විදේශ ණය අයිතම දෙකකට අදාළ එකතුව රු. මිලියන 4,399 ක ණය ශේෂයන්, දෙපාර්තමේන්තු පද්ධතියේ හා 2020 රජයේ මූල්‍ය ප්‍රකාශන අතර වෙනස් අගයක් පැවතීම. | ඉහත රු. මිලියන 10 ට අමතරව තව එක් ණයමුදලක් ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට ලැබී ඇතත් පද්ධතියට ඇතුළත් කර ඇත්තේ 2021 වර්ෂයේදීය. | -එම- |
| (V) | රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් රු. මිලියන 22,369 ක ණය ශේෂය, දෙපාර්තමේන්තු පද්ධතියේ ඇතුලත් වී නොතිබීම. | මෙම මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට 2020.12.15 දින බැරවී ඇතත් දෙපාර්තමේන්තු පද්ධතියට ඇතුළත් කර ඇත්තේ 2021 වර්ෂයේදීය. | -එම- |

| | | |
|---|---|---|
| (ආ) විදේශ ආධාර ලබාගැනීම හා ඒවා කාර්යක්ෂමව යෙදවීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් අදාළ පාර්ශව සමඟ කතිකාවන් සිදුකිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද, ඊට අදාළව මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛවලට අනුගත නොවූ අවස්ථා පැවති බව නිරීක්ෂණය විය. | | |
| (I) 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ විදේශාධාර ගිණුම් තැබීමට අදාළ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශ ආධාර සම්බන්ධ සියළු ගණුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කලයුතු බව සඳහන් වුවද, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, 2018 හා 2019 වර්ෂවල මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 24 ක් විසින් ව්‍යාපෘති 77 ක් සඳහා රු. මිලියන 2,026 ක විදේශ ප්‍රදාන ඍජුවම අදාළ ආයතන විසින් ලබාගෙන තිබුණි. | මෙම දෙපාර්තමේන්තුව මඟින් සහ භාණ්ඩාගාරයේ අනෙකුත් දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණයෙන් යුක්තව සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන වෙත විදේශ ප්‍රදාන ලබාගැනීමේ නිවැරදි ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කරමින් ඒ අනුව කටයුතු කරන ලෙස චක්‍රලේඛ හා උපදෙස් නිකුත් කර ඇත. | -එම- |
| (II) එසේම, නියැදි පදනම මත ලබාගත් තොරතුරු අනුව, 2020 වර්ෂය තුළ එසේ මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් එකතුව රු. මිලියන 1,266 ක විදේශ ප්‍රදාන ඍජුව ලබාගෙන තිබුණි. | නිකුත්කොට ඇති අදාළ චක්‍රලේඛ අනුව ප්‍රතිපාදන සලසාගැනීම අමාත්‍යාංශ ලේකම්වරයා සතු වගකීමකි. | -එම- |
| (ඇ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු අතර, ප්‍රමුඛ අංශ සංවර්ධන මූල්‍යනයන් සඳහා දැරිය හැකි පිරිවැයක් යටතේ විදේශ ණය ලබාගැනීමට හා විදේශ ණය කාර්යක්ෂම හා ඵලදායී භාවිතය සඳහා පහසුකම් සැලසීම ඇතුළත් විය. එසේ වුවද, විගණනයේදී නිරීක්ෂණය වූ පහත කරුණු හේතුවෙන් එම අරමුණු ලඟාකරගැනීමේදී දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම කොතරම් දුරට සාර්ථක වීද යන්න විගණනයේදී ප්‍රශ්නකාරී විය. | | |

| | | | |
|---|---|---|---|
| (I) | 2020 වර්ෂය තුළදී ගිවිසුම්ගතව ලබාගත් විදේශ ණයවල වටිනාකම ඇ.ඩො. මිලියන 1,281.1 ක් වූ අතර ඉන් සියයට 39 ක් චීන සංවර්ධන බැංකුවෙන් ලබාගත් ඇ.ඩො. මිලියන 500 ක මුදල වෙළඳපොල ණය බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂය පුරා පැවති කොවිඩ් වසංගත තත්ත්වය ඇතුළු රටේ ආර්ථික වර්ධනය අඩාල වීමට බලපාන අනෙකුත් කරුණු හේතුවෙන් වඩාත් පුළුල් වූ රටේ ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීම ඇතුළු කරුණු සඳහා ඇ.ඩො.මි.500ක කාලීන ණය පහසුකමක් ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් උපදෙස් ප්‍රකාරව මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ කටයුතු ක්‍රියාත්මක කොට ඇත. | -එම- |
| (II) | ප්‍රවර්ථන වර්ෂය තුළ ඇ.ඩො. මිලියන 4,057.9 ක් ණය සේවාකරණ ගෙවීම් සිදුකර තිබූ අතර ඉන් ඇ.ඩො. මිලියන 1,419.4 ක් එනම් සියයට 35 ක් පමණ ණය පොළී ගෙවීම වෙනුවෙන් ගෙවා තිබුණි. එය වර්ෂය තුළදී ගිවිසුම්ගතව ලබාගත් විදේශ ණයට වඩා ඉහළ අගයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | 2020 වර්ෂය අවසාන වනවිට විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො. බිලියන 35 කට ආසන්න වේ. ඒ අනුව වාර්ෂිකව ගෙවිය යුතු පොළී ප්‍රමාණය මේ වනවිට වැඩිවී ඇත. | -එම- |
| (III) | විදේශ ණය ලබාගැනීමේදී ගිවිසගත් ණය මුදලින් උපයෝජනය නොකළ වටිනාකම සඳහා ගිවිසුම් ප්‍රකාරව බොහෝ අවස්ථාවලදී රජය විසින් විශාල වියදමක් දරන බව නිරීක්ෂණය විය. ඒ වෙනුවට ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළදී ණය මුදල ලබාගෙන අදාළ ව්‍යාපෘතියට යොදවා එම ව්‍යාපෘතියෙන් ලැබෙන ප්‍රතිලාභවලින් ණය පොළී සහ වාරික ගෙවීම කාර්යක්ෂම ණය කළමනාකරණයක් තුළින් සිදුවිය යුතු වුවද, විදේශ ණය ලබාගැනීම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවලදී එසේ නොවන අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.<br>**(i) ණය අංක 2015025** | | |

| | | |
|---|---|---|
| මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇ.ඩො. මිලියන 76 ක ණය මුදලක් වසර 05 ක සහන කාල පරිච්ඡේදයක් සහිතව වසර 26 කින් ගෙවීමේ පදනම මත ලබාගැනීමට 2015 සැප්තැම්බර් 17 දින ගිවිසුම ගතවී තිබුණි. එහිදී ණය මුදලින් උපයෝජනය නොවූ ණය ශේෂය සඳහා 0.15% ක වගකීම් ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව 2020 ජූනි 20 දින වනවිට ණය ලබාගෙන අවසන් කළයුතු වුවත් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් එම ණය මුදලින් උපයෝජනය කර තිබුණේ ඇ.ඩො. 31,973,267 ක් පමණකි. ඒ අනුව ණය මුදලෙන් සියයට 58 ක් හෙවත් ඇ.ඩො. 44,026,733 ක් උපයෝජනය කර නොතිබුණි. ඒ සඳහා 0.15% වගකීම් ගාස්තුව ලෙස, 2020 වර්ෂයේ ජූනි සහ දෙසැම්බර් මාස වලදී එකතුව රු. 14,410,871 ක මුදලක් ගෙවා තිබුණි. | සුදුසුකම් ලැබූ කොන්ත්‍රාත්කරුගේ මූල්‍යමය හැකියාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙනත් ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබුවේ 2020 දෙසැම්බර් මාසයේදීය. ඒ අනුව කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රගතිය සැලසුම් කළ පරිදි සිදු නොවීම නිසා අදාළ දිනට ලබා ගැනීමට බලාපොරොත්තු වූ ප්‍රගතිය ලබා ගැනීමට නොහැකි වී ඇත. | ගිවිසුම් ගත ණය මුදල් උපයෝජනය කාර්යක්ෂම හා කඩිනම් කිරීම තුළින් රජයට දැරිය යුතු අමතර පිරිවැය අවම කර ගැනීම. |
| **(ii) ණය අංක 2015019** | | |
| බඩල්ගම කිරි සැපයුම් මධ්‍යස්ථානය ස්ථාපනය බැංකුවෙන් කිරීමේ ව්‍යාපෘතියෙහි පිරිවැය මූල්‍යනය කිරීම සඳහා HCBC අපනයන ණය පහසුකම් යටතේ යුරෝ 56,580,214 ණය මුදලක් වසර 03 ක සහන කාලයක් සහිතව වසර 13 ක ආපසු ගෙවීම් කාලයක් සහිතව ලබාගෙන තිබුණි. මෙම ණය මුදලේ උපයෝජනය නොකළ ශේෂය සඳහා වාර්ෂිකව 0.5% එකඟතා ගාස්තුවක් යටතේ ලබාගැනීමටද එසේම යුරෝ 9,975,863 ණය මුදලක් වසර 02 | ඉඩම් පවරාගැනීම ප්‍රමාදවීම, යන්ත්‍රෝපකරණ ඉදිකිරීම් පරිශ්‍රය වෙත ළඟා වීම ප්‍රමාදවීම හා කොවිඩ් - 19 වසංගත තත්ත්වය නිසා නියමිත දිනට ව්‍යාපෘතිය නිමකිරීමට නොහැකි වී ඇත. | -එම- |

| | | |
|---|---|---|
| ක සහන කාලයක් සහිතව වසර 06 ක ආපසු ගෙවීමේ කාලයක් සමඟ ලබාගැනීමටද 2015 අගෝස්තු 14 වන දින ගිවිසුම් ගත වී තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව 2020 දෙසැම්බර් 31 දින වනවිට ඉන් යුරෝ 59,190,497 ක් උපයෝජනය කර තිබූ අතර එදිනට උපයෝජනය නොකළ වටිනාකම යුරෝ 7,365,580 ක් විය. ඒ අනුව උපයෝජනය නොවූ එම වටිනාකම සඳහා ගිවිසුම් ප්‍රකාරව 0.5% ක වාර්ෂික එකඟතා ගාස්තුව ලෙස රු. 7,890,913 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. | | |

**(iii) ණය අංක 2007029**

| | | |
|---|---|---|
| රත්මලාන/ මොරටුව හා ජා-ඇල/ ඒකල ප්‍රාදේශයන්හි අපවිත්‍ර ජලය පිරිපහදු පහසුකම් සැලසීමේ ව්‍යාපෘතිය සඳහා යෝජිත ඇ.ඩො. 92,405,459 ක ණය මුදල වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව උපයෝජනය නොකරන ලද ණය ශේෂය මත පරිපාලනාත්මක ගාස්තු යටතේ වසරකට සියයට 0.03 අර්ධ වාර්ෂික ගාස්තුවක් ගෙවිය යුතු විය. ඒ් අනුව 2020 වර්ෂය තුළදී ඒ සඳහා රු. 3,149,851 ක් ගෙවා තිබුණි. | 2016.06.30 දින ඇ.ඩො. 2,655,196.71 ක ණය මුදල අවලංගුකර ඇත. ඉතිරි මුදල සම්පූර්ණයෙන්ම උපයෝජනය වී ඇති අතර, එබැවින් මෙම ණය ගිවිසුමට අදාළව උපයෝජනය නොවූ ශේෂයක් නොමැත. | -එම- |

**(iv) ණය අංක 2015026**

| | | |
|---|---|---|
| බදුල්ලේ සිට චෙන්කලාඩි දක්වා A – 5 මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සෞදි අරමුදලින් ඇ.ඩො. මිලියන 6 ක ණය මුදලක් එනම් සෞදි රියාල් 225,000,000 ක් වසර 05 ක | ශක්‍යතා අධ්‍යනය, මාර්ග සැලසුම්, ඉඩම් අත්පත් කරගැනීමේ හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2018 වර්ෂයේ ප්‍රදානය කර ඇත. | -එම- |

සහන කාල පරිච්ඡේදයක් සහිතව වසර 25 කින් ආපසු ගෙවීමේ පදනම මත සහ උපයෝජිත හා නොපියවූ මුදල මත වාර්ෂිකව සියයට 2 ක පොළී අනුපාතයකට යටත්ව ලබාගැනීමට 2015 ඔක්තෝබර් 30 දින ගිවිසුම් ගතවී තිබුණි. මෙම ණය මුදලට අදාළව 2015, 2016 සහ 2017 යන වර්ෂවලදී එකතුව ලෙස ඇ.ඩො. මිලියන 45 ක් ලබාගත යුතු වුවද ණය ලබාගැනීම ආරම්භ කර තිබුණේ 2018 වර්ෂයේදී බව නිරීක්ෂණය විය. තවද 2018 වර්ෂය අවසාන වනවිට ණය මුදල මුළුමනින්ම ලබාගෙන අවසන් කළ යුතු වුවත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් තවදුරටත් සවුදි රියාල් 157,246,745 ක මුදලක් එනම් සියයට 70 ක් පමණ ලබාගත යුතුව පැවතුණි.

(IV) ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව අංක 2019011 දරන "සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති" ව්‍යාපෘති ගිවිසුම අවසන් කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (i) අදාළ ණය ගිවිසුම අවසන් කිරීම හේතුවෙන් එම ව්‍යාපෘතියට අදාළ පෙර ගෙවුම් ගාස්තු (Front End Fee) ලෙස දැනටමත් දරා ඇති ජපන් යෙන් (¥) 60,080,000 මුදල සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරික්‍රියාමාර්ග පිළිබඳව මෙතෙක් තීරණයකට පැමිණ නොතිබුණු අතර ලබාගත් ණය මුදල ආපසු ගෙවන අවස්ථාවේදී මේ පිළිබඳව සාකච්ඡා කිරීමට නියමිත බව විගණනයට දන්වා තිබුණි. | ණය මුදල ආපසු ගෙවන අවස්ථාවේදී සාකච්ඡා කර එකඟතාවයකට එළඹීමට නියමිතය. | නිවැරදි අධ්‍යයනයන් හා විශ්ලේෂණ මත ව්‍යාපෘති කාර්යක්ෂම හා ඵලදායී භාවිතය සඳහා පහසුකම් සැලසිය යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | එසේම, 2020 දෙසැම්බර් 31 දින සිට උපදේශන කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීම හේතුවෙන්, අදාළ උපදේශන ආයතනය විසින් අලාභ හා හානි වෙනුවෙන් US$ 23,657,761 ද ඇතුළුව US$ 31,364,767 ක් සඳහා හිමිකම් පා තිබුණු අතර මුළු හිමිකම් පෑමට සාපේක්ෂව අලාභ හානි අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 75 ක් විය. | මීට අදාළ කමිටු වාර දෙකක් රැස් වී ඇති අතර ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී. | -එම- |
| (iii) | 2021 ජනවාරි 19 දින වන විට අදාළ ණය මුදලින් ජපාන යෙන් (¥) 2,905,525 එනම් රු. 4,886,234,915 ක් උපයෝජනය කර තිබුණ අතර ණය ගිවිසුම අවසන් කිරීමට තීරණය කිරීම හේතුවෙන් උපයෝජිත මුදල නැවත ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳව එකඟතාවයකට මෙතෙක් පැමිණ නොතිබුණි. | කමිටුවේ තීරණය මත මෙම ගිවිසුමට අදාළ ඉදිරි කටයුතු සිදුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ. | -එම- |
| (iv) | 2021 ජනවාරි මස වනවිටත් මෙම ව්‍යාපෘතියේ කාර්යාලය වසාදැමීම ඇතුළුව ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු අවසන් කර නොමැති බවට වාර්තා විය. එසේම ලිපිගොනු අනුව මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට සමගාමීව විකල්ප ව්‍යාපෘතියක් පිළිබඳ තොරතුරු හා දැනටමත් ලබාගෙන තිබූ උපදේශන සේවා ප්‍රමාණය වෙනත් ව්‍යාපෘතියක් සඳහා කාර්යක්ෂමව යෙදවීමට සැලසුම් කර ඇති බව නිරීක්ෂණය වුවත් ඒ පිළිබඳව විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම කටයුතු මූලික අදියරයේ පවතින බැවින්, මේ වන තෙක් එහි ප්‍රගතිය පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව දැනුවත් කොට නොමැත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විගණනයට ඉදිරිපත් කළ කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ ප්‍රගතිය සියයට 100 ක් ලෙස දක්වා තිබුණි. එහෙත් අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුවේ නවීකරණ කටයුතු සඳහා දරන ලද වියදමෙහි ඇතුළත් වත්කම් අඩුවෙන් වාර්තා කර තිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ ප්‍රගතිය එපරිදි නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ 3.8 මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් සටහන් වීම කාර්යසාධන වාර්තාවේ නිවැරදි කර ඇත. | නිවැරදි හා යාවත්කාලීන තොරතුරු පවත්වාගත යුතු වීම හා වාර්තා කිරීම. |
| (ඉ) | කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ 4.1 ඡේදයෙහි සඳහන් අපේක්ෂිත නිමවුම සහ සත්‍ය නිමවුම සලකා බැලීමේදී, මූල්‍යමය බැඳීම් හා මූල්‍ය උපයෝජනයෙහි අපේක්ෂිත නිමවුම තීරණය කිරීමේදී පිළිවෙලින් ළඟාවීම සියයට 147 ක් හා 190 ක් ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන් එය ඌන තක්සේරු වී ඇති බවක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මෙයින් අපේක්ෂිත ණය ප්‍රමාණයට වඩා වර්ෂය තුළදී ණය ලබාගැනීමක් ගම්‍ය වන අතර එය රජයේ ණය කළඹ ඉහළයෑමට හේතුවන බව නිරීක්ෂණය විය. | අපේක්ෂිත නිමවුම හා සත්‍ය නිමවුම අතර වෙනස සඳහා පහත කරුණු බලපා ඇත.<br>1. චීන සංවර්ධන බැංකුව වෙතින් ලබාගත් ඇ.ඩො. මිලියන 500ක කාලීන ණය පහසුකම 2020 වර්ෂයේ අපේක්ෂිත නිමවුම සඳහා ඇතුලත් කොට නොතිබීම.<br>2. ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගැනීමට නියමිතව තිබූ ණය මුදල කොවිඩ් - 19 තත්ත්වය හමුවේ ඉහළ යාම හා ලෝක බැංකුව (WB) අතිරේක අරමුදල් යෙදවීම. | පූර්ව ඇගයීම් සිදුකරමින් ණය කළමනාකරණය විධිමත් කිරීම. |

**3.1 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් අමාත්‍යාංශයේ වියදමින් දෙපාර්තමේන්තුවේ සිදුකරන ලද එකතුව රු.22,160,324 වටිනාකමකින් යුතු වත්කම් නිසි පරිදි දෙපාර්තමේන්තුව වෙත භාරගෙන, ලේඛනගත කිරීමට අවශ්‍ය කටයුතු මෙතෙක් සිදුකර නොතිබුණි. | දෙපාර්තමේන්තුවෙහි නවීකරණ කටයුතු මුදල් අමාත්‍යාංශයේ වියදමින් සිදුකරන ලද අතර, මුදල් අමාත්‍යාංශය විසින් අවශ්‍ය ලේඛන විධිමත් පරිදි මෙම දෙපාර්තමේන්තුව වෙත 2020.12.31 දිනට පෙර භාරදී නොතිබීම නිසා ඒවා පරීක්ෂාකර දෙපාර්තමේන්තු පොත්වලට ඇතුළත් කිරීමේ කටයුතු ප්‍රමාද විය. එම කටයුතු දැනටමත් සිදුකරමින් පවතී. | දෙපාර්තමේන්තුවට අදාළ වත්කම් භාරගැනීම හා ලේඛනගත කිරීම කඩිනම් කිරීම. |